GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

08/10/2012

# මාධ්‍ය නිවේදනයයි.

**ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය, වෛද්‍ය සභා ආඥා පනත උල්ලංඝනය කිරීම තරයේ හෙලා දකිමු.**

සැහැල්ලු වාහන රියදුරු බලපත් නිකුත් කිරීමට සුදුසුකම් ලත් වෛද්‍යවරයෙකු, ඉල්ලුම්කරු පරික්ෂාකර බලා යෝග්‍යතාවය සහතික කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. මේ සඳහා එම්.බී.බී.එස් වෛද්‍ය උපාධිය හෝ ඊට සමාන උපාධියක් සහිත වෛද්‍යවරයෙකු පමණක් සුදුසුකම් ලබන බව වෛද්‍ය සභා ආඥාපණතේ 29 වගන්තිය මඟින් තහවුරු කර ඇත.

එය එසේ හෙයින්, ප්‍රවාහන වෛද්‍ය ආයතනය ගත් තීරණය අනුව සහකාර වෛද්‍ය නිලධාරී (සහකාර වෛද්‍ය වෘත්තික / ඇපෝතිකවරු) සහතික කරන ලද වෛද්‍ය සහතික පිලිගැනීම නීතිවිරෝධී වේ. මේ බව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී වෛද්‍ය එන්.ජේ නෝනිස් කරුණු පැහැදිලි කර නීතිමය තත්වය පෙන්වා දී ඇතත්, එය නොසලකා නීති විරෝධී ලෙස සහතික කල වෛද්‍ය වාර්තා පිලිගැනීම රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය තරයේ හෙලා දකී.

සහකාර වෛද්‍ය වෘත්තිකයන් අත්‍යවශ්‍ය වෛද්‍ය පරික්ෂාවන් සිදුකිරීමට පුහුණු කර නොමැති අතර ඔවුන්ට උපාධියක් ද රහිත නිසා මෙම සහකාර වෛද්‍ය වෘත්තිකයින් යොග්‍යතා සෞඛ්‍ය සහතික නිකුත් කිරීමට සුදුසු නැති බවත් ඔවුන් ඒ සඳහා ලියාපදිංචි නොකරන ලෙසත් අප සංගමය අදාල බලධාරීන් කිහිප විටක් දැනුවත් කොට ඇත. නමුත් මේ වන තෙක් එය ක්‍රියාත්මක වී නැත.

මේ අනුව දුබලතා සහිත රියදුරන් නිසා සිදුවන රිය අනතුරුවල වගකීම අදාල බලධාරීන් බාර ගනු ඇතැයි බලාපොරොත්තු වෙමු.

මේ ආකාරයට වගකීමෙන් තොරව කටයුතු කරන බලධාරීන් පිළිබඳ අප දැඩි අප්‍රසාදය පල කරන අතර ඉදිරියේදී අප ගන්නා වෘත්තීය සමිති ක්‍රියාමාර්ග වල වගකීමද ඔවුන් වෙත පැවරෙන බවත් තරයේ අවධාරනය කරමු.

ස්තුතියි

වෛද්‍ය නලින් ආරියරත්න
සහකාර ලේකම්

වෛද්‍ය නලින් ආරියරත්න 0714800942
වෛද්‍ය නවීන් ද සොයිසා 0718582444